# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය

## රීති

1. මේ රීති 1988 ශ්‍රේෂ්ඨාධිකරණයේ (නීතිඥවරයන් සඳහා වූ වෘත්තීය පැවැත්ම සහ ආචාරධර්ම පිළිබඳ) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම රීති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇතුළත් කර ගනු ලබන සහ බඳවා ගනු ලබන සෑම නීතිඥවරයකුම සම්බන්ධයෙන් අදාළ වන්නේය.

3. තම වෘත්තිය තත්ත්වයෙන් යම් ධුරයක් හෝ පත්වීමක් දරණ නීතිඥවරයකුට එම සේවා නියුක්තියේ තම කාර්යයන් යථා පරිදි ඉටු කිරීම පිණිස අවශ්‍ය වන තාක් දුරට පමණක් වෘත්තියෙහි නිරත වීමේ හිමිකම ඇත්තේ ය.

4.යම් නෛතික කාරණයක දී හෝ නඩු කටයුත්තක දී යම් නීතිඥවරයකු පෙනී සිටීම ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක එසේ ලියා පදිංචි කරනු ලැබූ නීතිඥවරයා විසින් වෙනත් නීතිඥවරයකුට එකී නෛතික කාරණයේ දී හෝ නඩු කටයුත්තේ දී පෙනී සිටින ලෙස උපදෙස් දෙනු ලැබ ඇත්නම් මිස වෙනත් නීති ඥවරයකු ඒ කාරණයේ දී හෝ නඩු කටයුත්තේ දී හෝ පෙනී නොසිටිය යුතු ය. එසේ වුව ද අධිකරණය විසින් එම නෛතික කාරණයේ දී හෝ නඩු කටයුත්තේ දී හෝ පෙනී සිටීමට වෙනත් නීතිඥ වරයකු වෙන් කර දීම හෝ පත් කිරීම හෝ කරනු ලැබීය හැකි ය.

## උපදෙස් බාර ගැනීම

5. කිසිම නීතිඥවරයකු විසින් යුක්තිය පසිඳලීම පිණිස පිහිටුවා ඇති යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් හෝ ආයතනයක් ඉදිරියේ විභාග වන යම් කාරණයක දී හෝ නඩු කටයුත්තක දී හෝ වෘත්තීය කාරණයක දී, එම නීතිඥවරයා විසින් එවැනි වර්ගයේ කාරණා හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් අය කරනු ලබන ගාස්තුව ගෙවීමට සේවාදායකයා සූදනම් නම්, යම් පාර්ශ්වයක් හෝ තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප නොකළ යුතුය.

එසේ වුව ද යම් පාර්ශ්වයක් හෝ තැනැත්තකු වෙනුවෙන් ක්‍රියා කිරීමෙන් තමාට තමාගේ වෘත්තීය ස්වාධීනත්වය පවත්වා ගෙන යාම දුෂ්කර විය හැකි යයි හෝ එවැනි වෘත්තීය කාරණයක් බාර ගැනීමෙන් නිසි ලෙස යුක්තිය පසිඳලීමට නොහැකි වන තත්ත්වයක් ඇති විය හැකි යයි නීතිඥවරයකු අදහස් කරන විශේෂ අවස්ථාගතකරුණු යටතේ, එම නීතිඥවරයා විසින් යම් පාර්ශ්වයක් හෝ තැනැත්තකු හෝ වෙනුවෙන් ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

6 යම් නීතිඥවරයකුට යම් වෘත්තීය කාරණාවක් සම්බණ්ධයෙන් පෞද්ගලික සම්බන්ධතාවක් තිබෙන අවස්ථාවක, එම සම්බන්ධතාව සේවාදායකයාට සම්පූර්ණයෙන්ම අනාවරණය කිරීමෙන් පසුව සහ එම නීතිඥවරයා තමා වෙනුවෙන් ක්‍රියා කිරීම ගැන ඒ සේවාදායකයාගේ විරෝධතාවක් නොමැති බවට ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් ලබා ගැනීමෙන් පසුව මිස, ඒ නීතිඥවරයා විසින් යම් පාර්ශ්වයක හෝ තැනැත්තකු හෝ වෙනුවෙන් ක්‍රියා නොකළ යුතුය.

7. යම් වෘත්තීය කාරණයක දී හෝ ඒ කාරණය සම්බන්ධයෙන් යම් නීතිඥවරයකු විසින් ක්‍රියා කිරීම හෝ උපදෙස් දීම, ඒ නීතිඥවරයාගේම වෙනත් සේවාදායකයකුගේ සම්බන්ධතාව සමඟ ගැටුමක් සිදු වේ යයි ඒ නීතිඥවරයා අදහස් කරන අවස්ථාවක ඒ වෘත්තීය කාරණාව සම්බන්ධ යෙන් එම නීතිඥවරයා විසින් ක්‍රියා කිරීම හෝ උපදෙස් දීම හෝ නොකළ යුතුය.

8. යම් සේවාදායකයන් කිහිප දෙනකු වෙනුවෙන් යම් නීතිඥයකු ක්‍රියා කරන විටක, ඔවුන් අතුරින් දෙදෙනකුගේ හෝ වැඩි දෙනකුගේ සම්බන්ධතා අතර ගැටුමක් උද්ගතවන අවස්ථාවක, තමාට, යම් වෘත්තීය අයෝග්‍යතාවක් හෝ තමා වෘත්තීය වශයෙන් දුෂ්කර අවස්ථාවකට පත් වීමක් සිදු නොවන අයුරින් එම සේවාදායකයන් අතුරින් යම් එක් සේවාදායකයකු හෝ වැඩි දෙනකු වෙනුවෙන් තමාට පෙනී සිටිය හැකි බවට එම නීතිඥවරයා තීරණය කල හොත් සහ ඔහුට එසේ පෙනී සිටිය හැකි බවට සෙසු සේවාදායකයා හෝ සේවාදායකයන් එකඟ වුවහොත් හැර එම නීතිඥවරයා විසින් එම සියලුම සේවාදායකයන් සඳහා ක්‍රියා කිරීම නතර කළ යුතුය.

09. තමා යම් ධුරයක් හෝ පත්වීමක් දැරීම නිසා, තමා දුෂ්කර අවස්ථාවකට පත් විය හැකි යයි නීතිඥවරයකු අදහස් කරන අවස්ථාවක, ඒ නීතිඥවරයා විසින් ඒ වෘත්තීය කාරණය බාර නොගත යුතුය.

10. නිසි උද්යෝගයෙන් යම් වෘත්තීය කාරණයක් සම්බන්ධ යෙන් තමාට ක්‍රියා කළ හැකි නම් මිස, නීතිඥවරයකු විසින් ඒ කාරණය බාර නොගත යුතුය.

11. යම් වරදක් කිරීමෙහි ලා හෝ තවදුරටත් ඒ වරද කර ගෙන යාමෙහි ලා හෝ තමා සම්බන්ධ විය හැකි කිසිම වෘත්තීය කාරණයක් නීතිඥවරයකු විසින් බාර නොගත යුතු ය.

12. යම් වෘත්තීය කාරණයක් සම්බන්ධයෙන් තමා සාක්ෂිකරුවකු ලෙස අවශ්‍ය විය හැකි බව තමා දැන සිටින හෝ එසේ අවශ්‍ය විය හැකි යයි විශ්වාස කිරීමට නීතිඥවරයකුට හේතු ඇති අවස්ථාවක, ඒ කාරණය ඒ නීතිඥවරයා විසින් බාර නොගත යුතු ය. යම් වෘත්තීය කාරණයක් බාර ගැනීමෙන් පසුව, ඒ කාරණයම සම්බන්ධයෙන් සාක්ෂිකරුවකු ලෙස තමා අවශ්‍ය බවට නීතිඥවරයකුට පෙනී ගිය අවසථාවක දී ද එම ප්‍රතිපත්තිය ම අදාළ වන්නේය.

එසේ වුව ද යම් වෘත්තීය කාරණයක යම් විධිමත් හෝ විවාදීය නොවන කාරණයක් සම්බන්ධයෙන් පමණක් සාක්ෂිකරුවකු ලෙස නීතිඥවරයකු අවශ්‍ය වන අවස්ථාවක ඒ නීතිඥවරයා විසින් ඒ කාරණාව බාර ගත හැකි ය.

13. නීති ව්‍යාපාරික ආයතනයක නීතිඥවරයකු, වෙන වෙනම වූ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතාවල ගැටුමක් පවතින හෝ පැවතීමට ඉඩ තිබෙන අවස්ථාවක, එකී පාර්ශ්වකරුවන් සඳහා යම් කාරණයක දී හෝ නඩු කටයුත්තක දී හෝ පෙනී නොසිටිය යුතුය.
එසේ වුව ද ආරවුලෙහි පාර්ශ්වකරුවන් අතර, සමථයකට පත් කිරීමක් හෝ සමථයකට පත් කිරීම සඳහා සමඟි කිරීමේ අරමුණ ඇතිව කරන ලද සාකච්ඡා සම්බන්ධයෙන් මේ රීතිය අදාළ නොවන්නේ ය.

14. ශ්‍රී ලංකාවේ නීතිඥවරයන්ගේ සංගමය විසින් අනුමතකරන ලද නීති ආධාර යෝජනා ක්‍රමයේ නම සඳහන් වී ඇති නීතිඥවරයකු විසින්, උපදෙස් දීම හෝ උපදෙස් බාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම, ඉහත සඳහන් හේතු අතුරින් යම් හේතුවක් නිසා යුක්ති සහගත වන්නේ යයි තම අභිමතය පරිදි තීරණය කරනු ලැබුවහොත් මිස, එම යෝජනා ක්‍රමය යම් සේවාදායකයකුගේ සුදුසුකම පිළිගෙන ඇති අවස්ථාවක, ඒ සේවාදායකයාට, ඒ නීතිඥවරයා විසින් අතිරේක අය කිරීමකින් තොරව තම වෘත්තීය සේවය පිරිනැමිය යුතු ය.

ඒ ආකාරයෙන් ම, රජයෙන් පත් කරන ලද නීතිඥවරයකුට ද, රජය විසින් ඔහුට ගෙවනු ලබන ගාස්තුව හැර, තමා විසින් විත්තිවාචකය බාර ගනු ලැබ ඇති චූදිතයකුගෙන් වෙනත් කිසිම ගාස්තුවක් අය කර ගැනීමට හිමිකමක් නොමැත්තේ ය.

## සේවයේ රඳවා ගැනීමෙන් පසුව

15. සේවාදායකයකුගෙන් හෝ සේවාදායකයකු වෙනුවෙන් හෝ යම් වෘත්තීය කාරණයක් බාර ගනු ලැබූ විට, ඒ කාරණය සම්බන්ධයෙන් තම සේවාදායකයාගේ උපරිම යහපතට හේතු වන පරිදි, තමන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ ඇති විය හැකි අප්‍රසන්න ප්‍රතිඵල

ගැන නොතකා නිසි උද්යෝගයෙන් තම නිපුණතාව දක්වා සැලකිල්ලෙන් ක්‍රියා කිරීම නීතිඥවරයකුගේ යුතුකම වන්නේ ය. තව ද, යුක්තිය පසිඳලීම සඳහා පිහිටුවන ලද යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් නැතහොත් වෙනත් ආයතනයක් ඉදිරියේ තමා පෙනී සිටින විට ඒ අධිකරණයට, විනිශ්චයාධිකාරයට හෝ ආයතනයට ද, තමාට විරුද්ධව පෙනී සිටින තම සහෝදර නීතිඥවරයන් කෙරෙහි ද ඉටු විය යුතු තම යුතුකම පිළිබඳව නිසි සැලකිල්ල ඇතිව ඔහු විසින් සෑම අවස්ථාවක දී ම ක්‍රියා කළ යුතුය.

16. යුක්තිය පසිඳලීම සඳහා පිහිටුවන ලද යම් අධිකරණයක, විනිශ්චයාධිකාරයක, හෝ වෙනත් ආයතනයක නඩු කටයුත්තක දී, යම් නීතිඥවරයකුගේ සේවාව රඳවා ගෙන ඇති අවස්ථාවක, තමාගේ පාලනයට විෂය නොවන අවස්ථානුගත කරුණු නිසා පෙනී සිටීමට නොහැකි වී තිබේ නම් මිස, එම කාරණයේ දී හෝ නඩු කටයුත්තේ දී පෙනී සිටීම. ඒ නීතිඥවරයාගේ යුතුකම වන්නේය.

17. යම් වෘත්තිය කාරණයක් සඳහා තමා සේවයෙහි රඳවා ගනු ලැබ ඇති අවස්ථාවක, ඒ කාරණයේ දී නීතිඥවරයකු විසින් ලාභ තකා නඩු කීමේ වාසියක්, තම සේවදායකයාගෙන් ලබා නොගත යුතුය.

18. තම සේවාදායකයන්ට උපදෙස් දීමේ දී සහ ඔවුන් සමඟ කරන සියලු කටයුතුවල දී නීතිඥවරයකු ' විසින් සම්පූර්ණයෙන්ම ඍජු ලෙස සහ අවංකව ක්‍රියා කළ යුතුය.

18. (අ) තම සේවාදායකයාට අවාසිදායක වන සහ/ හෝ හානිකර වන ආකාරයකින් නීතිඥවරයකු විසින් කිසිම විටක ක්‍රියා නොකළ යුතු ය.

## නීතිඥවරයකු ලෙස ක්‍රියා කිරීම නතර කිරීම

19. නීතිඥවරයකු සේවාදායකයකුගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසු හොඳ හේතුවක් මත හැර, ඒ සම්බන්ධ තම සේවාවන් ඉටු නොකර ඉවත් නොවිය යුතු ලෙසට යුතුකමකට ඔහු යටත් වන්නේය.

20. තම නීතිඥවරයාගේ උපදෙස් පිළිගෙන ඒ මත ක්‍රියා කිරීමට සේවාදායකයෙකු ප්‍රතික්ෂේප කරන්නා වූද ඒ නිසා, තම සේවාදායකයා වෙනුවෙන් තවදුරටත් ක්‍රියා කිරීම නුසුදුසු යයි හෝ එසේ තවදුරටත් ක්‍රියා කිරීමෙන් තමා දුෂ්කර තත්ත්වයකට පත් වන්නේ යයි, හෝ ඒ නීතිඥවරයා තීරණය කරන්නා වූ ද අවස්ථාවක හෝ නීතිඥ වරයකු සහ ඔහුගේ සේවාදායකයා අතර විශ්වාසය කඩ වීමක් සිදු වී ඇති අවස්ථාවක ඒ නීතිඥවරයා විසින් ඒ සේවාදායකයා වෙනුවෙන් ක්‍රියා කිරීම නතර කළ හැකි ය.

21. යම් වෘත්තීය කාරණයක දී හෝ නඩු කටයුත්තක දී වැඩිපුර උපදෙස් දෙන ලෙස සේවාදායකයාගෙන් ඉල්ලා සිටි විට, තම සේවාදායකයා වෙනුවෙන් තවදුරටත් ක්‍රියා කිරීමට නීතිඥවරයාට බලයක් නොතිබෙන අවස්ථාවක් ඇති වන පරිදි, එසේ වැඩිදුර උපදෙස් දීම සේවාදායකයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුව හොත් හෝ, නොසලකා හරිනු ලැබුවහොත්, තම සේවාදායකයා වෙනුවෙන් ක්‍රියා කිරීම නීතිඥවරයා විසින් නතර කළ හැකි ය.

22. යම් වෘත්තීය කාරණයක් සම්බන්ධයෙන් නීතිඥවරයාගේ ගාස්තු ගෙවීම හෝ ඒ සම්බන්ධයෙන් වැය වූ මුදල් ආපසු ගෙවීම සඳහා කටයුතු සැලැස්වීම තම සේවාදායකයා විසින් පැහැර හරිනු ලැබුවහොත්, එම නීතිඥවරයාට එම වෘත්තීය කාරණයෙන් ඉවත් විය හැකිය.

23. නීතිඥවරයකු වෘත්තියෙහි යෙදී සිටීම නතර කළ විට එසේ වෘත්තියේ යෙදීම නතර කිරීම පිළිබඳව තම සේවාදායකයාට හෝ සේවාදායකයන්ට සාධාරණ කාලයක් සහිත දැනුම් දීමක් කිරීම ඒ නීතිඥවරයාගේ යුතුකම වන්නේය.

24. නීතිඥවරයකු හවුල් ව්‍යාපාරයක් ලෙස තම වෘත්තියෙහි යෙදී සිටින්නා වූද, එකී හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීමට හෝ වෙනත් ව්‍යාපාරික ආයතනයක් සමඟ ඒකාබද්ධ වීමට හෝ අදහස් කරන්නා වූ ද, අවස්ථාවක වෘත්තියේ යෙදීම නතර කිරීම හෝ ඒකාබද්ධ කිරීම හෝ පිළිබඳව තම සේවාදායකයන් වෙත දැන්වීම වෘත්තියේ යෙදීම නතර කරන හෝ ඒකාබද්ධ වන හෝ ඒ හවුල් ව්‍යාපාරයෙහි යුතුකම වන්නේය.

25. තමා වෙනුවෙන් ක්‍රියා කිරීම නතර කරන ලෙස සේවාදායකයෙකු නීතිඥවරයකුගෙන් ඉල්ලා සිටිය හොත් නීතිඥවරයා එම සේවාදායකයා වෙනුවෙන් ක්‍රියා කිරීම නතර කළ යුතුය.

26. නීතිඥවරයකු වෙත බාර දී ඇති සේවාදායකයකුගේ සියලු දේපළ, ඒ නීතිඥවරයා විසින් තමා වෙත සුරක්ෂිතව තබා ගෙන ආරක්ෂා කළ යුතුය.

## ගාස්තු ගෙවීම සහ වියදම් ආපසු ගෙවීම

27. නීතිඥවරයකු විසින් වෘත්තියේ උසස් සම්ප්‍රදායන්ට අනුව, සේවාදායකයකුගේ හෝ මතු අපේක්ෂිත සේවාදායකයකුගේ දිළිඳුකම හෝ ඒ සේවාදායකයාට සිදු වන දුෂ්කරතා හේතු කොට ගෙන හෝ එසේ නැතහොත් සේවාදායකයාට නීති උපදෙස් හෝ නියෝජනය නියත ලෙස අහිමි වූ අවස්ථාවක හෝ ගාස්තුව අඩු කිරීම හෝ අත් හැරීම හෝ කළ හැකි ය.

28. යම් නිශ්චිත කාර්යයක් සඳහා භාරයක් වශයෙන් තමා වෙත රඳවා ගනු ලැබ ඇති, තම සේවාදායකයාගේ මුදල්, තම සේවාදායකයාගේ අවසරය ඇතිව හැර, නීතිඥවරයකු විසින් තම ප්‍රයෝජනයට නතුකර නොගත යුතු ය.

29. " සේවයේ රඳවා ගැනීම " යන්නෙන්, සේවාදායකයකු එවකට සම්බන්ධ වී සිටින නඩුහබයක දී තමා වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥවරයාගේ ගාස්තු ගෙවීමට යටත්ව සහ නීතිඥවරයා විසින් නියම කරනු ලබන කොන්දේසි වලට යටත්ව, ඒ සේවාදායකයා විසින් නීතීඥවරයකු සේවයේ නිරත කර ගැනීම අදහස් වේ.

“විශේෂයෙන් සේවයේ රඳවා ගැනීම " යන්නෙන්, මතු ඇති විය හැකි යම් සිවිල් නඩුවක දී හෝ අපරාධ නඩුවක දී නීතිඥවරයාගේ ගාස්තු ගෙවනු ලැබීමට යටත්ව, සේවා දායකයකු විසින් තමා වෙනුවෙන් පෙනී සිටීමට හෝ ක්‍රියා කිරීමට නීතිඥවරයකු සේවයේ නිරත කර ගැනීම අදහස් වේ.

“සාමාන්‍යයෙන් සේවයේ රඳවා ගැනීම " යන්නෙන්, සේවාදායකයකු යම් වේලාවක සම්බන්ධව සිටින නඩු හබයක් පිළිබඳ සියලු කාරණා සඳහා නීතිඥවරයාගේ ගාස්තු ගෙවීමට සහ නීතිඥවරයා විසින් නියම කරනු ලබන නියමයන්ට යටත්ව, ඒ සේවාදායකයා වෙනුවෙන් පෙනී සිටීම සඳහා ඒ සේවාදායකයා විසින් නීතිඥවරයකු සේවයේ නිරත කර ගැනීම අදහස් වේ.

30. (අ) නීතිඥවරයකු සාමාන්‍යයෙන් සේවයේ රඳවා ගැනීමක් කරනු ලැබීමෙන් පසුව, එම රඳවා ගැනීම අදාළ වන යම් කාරණයකට අදාළව සේවාදායකයා විසින් එම නීතිඥවරයාට උපදෙස් නොදෙනු ලැබූ අවස්ථාවක, සේවාදායකයා තමා උපදෙස් නොදුන්නේ කවර හේතුවක් නිසා දැයි ඔහුගෙන් විමසීමෙන් පසුව සෑහෙන කාල සීමාවක් ඉකුත්ව ඇත්නම්, ඒ කාරණය සම්බන්ධයෙන් එකී රඳවා ගැනීම අවසාන කරනු ලැබ ඇති ලෙස එම නීතිඥවරයා විසින් සැලකිය හැකිය.

(ආ) එම ප්‍රතිපත්තිය විශේෂයෙන් රඳවා ගැනීමක් සම්බන්ධයෙන් අදාළ විය හැකි අවස්ථාවල දී අදාළ වන්නේය.

## රහස්‍ය තොරතුරු

31. තම සේවාදායකයාගේ ව්‍යාපාර සහ කටයුතු සම්බන්ධයෙන් වූ හා ඒවාට අදාළ යම් කරුණක දී තම සේවාදායකයාගෙන් හෝ ඔහු වෙනුවෙන් නීතිඥවරයකු විසින් ලබා ගන්නා ලද වාචික හෝ ලේඛනගත සියලු තොරතුරු, ඒ නීතිඥවරයා විසින් දැඩි ලෙස රහසිගතව තබා ගත යුතුය.

32. තම සේවාදායකයා විසින් හෝ තම සේවාදායකයා මිය ගොස් ඇති අවස්ථාවක, සේවදායකයාගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් හෝ එම තොරතුරු අනාවරණය කිරීමට ලියවිල්ලකින් අවසර දී ඇත්නම්, නීතිඥවරයකු විසින් එම තොරතුරු අනාවරණය කළ හැකිය. එවැනි අවස්ථාවක වුව ද, අවස්ථානුකූලව අවශ්‍ය වන

තොරතුරු පමණක් මිස, ඊට වැඩි තොරතුරු අනාවරණය නොකිරීම සඳහා ඔහු විසින් සැලකිල්ලෙන් සහ ප්‍රවේශමෙන් ක්‍රියා කළ යුතුය.

33. රහස්‍ය තොරතුරු අනාවරණය කිරීමෙන් නීතිඥවරයකු වැළකී සිටිය යුතු බවට වූ යුතුකම, එම සේවාදායකයා සමඟ ඔහුගේ වෘත්තිය සම්බන්ධතාව පවත්නා කාලය තුළ දී පමණක් නොව, එකී නීතිඥවරයා එකී සේවා දායකයා වෙනුවෙන් ක්‍රියා කිරීම අවසන් කිරීමෙන් පසුවද, සේවාදායකයාගේ මරණයෙන් පසුව ද සදහට ම ඔහු වෙත පැවරෙන්නේ ය.

34. එම යුතුකම, එම නීතිඥවරයාගේ යම් වෘත්තිය හවුල්කරුවකු හෝ සහකරුවකු වෙත ද එම නීතිඥවරයාගේ යම් සේවා නියුක්තයකු වෙත ද ව්‍යාප්ත වේ. නීතිඥවරයකුට සාමාන්‍ය කටයුතු කරනු ලබන අතර එවැනි තැනැත්තකුට එවැනි තොරතුරක් දැන ගන්නට ලැබුණ හොත්, එම තැනැත්තා සමඟ සම්බන්ධතාව අවසන් වීමෙන් පසුව වුව ද ඒ තොරතුරු එම තැනැත්තා විසින් අනාවරණය කිරීම වැළැක්වීම පිණිස සියලු සාධාරණ පියවර ගැනීම එකී නීතිඥවරයාගේ යුතුකම වන්නේය.

35. තම සේවාදායකයා පිළිබඳ රහස්‍ය තොරතුරු නීතිඥවරයකු දන්නා විටක ඒ නීතිඥවරයා පෙනී සිටින කාරණය පිළිබඳව ඒ කාරණයේ විරුද්ධකරු වෙනුවෙන් යම් වෘත්තීය වැඩක් බාර ගැනීම හෝ තම සේවාදායකයා සහ වෙනත් කාරණයක වෙනත් පාර්ශ්වකරුවකු අතර ප්‍රතිවිරුද්ධතාවක් පවතින හෝ ප්‍රතිවිරුද්ධතාවක් ඇති විය හැකි විටක හෝ එකී වෙනත් කරුණ සම්බන්ධයෙන් ඒ නීතිඥවරයා යම් වෘත්තීය වැඩක් බාර ගැනීම වෘත්තීය ආචාර ධර්මවලට පටහැනි වන්නේය. තවද, එම තොරතුරු වෙනත් යම් වෘත්තීය කටයුත්තක දී එම නීතිඥවරයාගේ කලින් සිටි සේවාදායකයකුට හානිකර වන පරිදි යොදා ගත හැකි නම්, එකී නීතිඥවරයා විසින් ඒ වෙනත් කටයුත්ත භාර නොගත යුතුය.

36. යම් වෘත්තීය කටයුත්තක් සඳහා කලින් සේවාදායකයකු විසින් රඳවනු ලැබ සිටිය දී රහස්‍ය තොරතුරු කිසිවක් යම් නීතිඥවරයකුට ලැබී නොමැති අවස්ථාවක ඒ වෘත්තීය කටයුත්තේ ම විරුද්ධ

පාර්ශ්වය වෙනුවෙන් වෘත්තීය කටයුතු භාර ගැනීමට ඒ නීතිඥවරයාට බාධාවක් නැත.

37. ඉහත සඳහන් විධිවිධාන එක් නීති ව්‍යාපාර ආයතනයක් වෙනත් නීති ව්‍යාපාර ආයතනයක් සමඟ ඒකාබද්ධ වන හෝ අලුත් නීති ව්‍යාපාර ආයතනයක් පිහිටුවනු ලැබූ හෝ අවස්ථාවක ද අදාළ වන්නේ ය.

38. 32 වන රීතියේ සඳහන් අවස්ථාවලට අතිරේකව සහ යම් ලිඛිත නීතියකට යටත්ව නීතිඥවරයකු විසින් -
(1) තමාට හෝ තම සහකාරයන්ට හෝ සේවානියුක්තයන්ට විරුද්ධව විෂමාචාරයක් නැතහොත් අයථා ක්‍රියාවක් පිළිබඳව තම සේවාදායකයා විසින් කරන ලද යම් චෝදනාවක දී තමා, තම සහකාරයා හෝ සේවාදායකයා හෝ සේවානියුක්තයා සඳහා විත්තිවාචකයක් වශයෙන්,

(2) අපරාධයක්, වංචාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් වැළැක්වීම පිණිස හෝ

(3) හවුල් රඳවා ගැනීමක් සම්බන්ධයෙන් වූ විට හෝ සේවාදායකයාට වෙනත් අය සමඟ හවුල් සම්බන්ධතාවක් තිබෙන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි, හවුලේ රඳවනු ලැබූ සාමාජිකයන් වෙත හෝ සේවාදායක සමඟ හවුල් සම්බන්ධතා තිබෙන තැනැත්තන් වෙත රහස්‍ය තොරතුරු අනාවරණය කරනු ලැබිය හැකි ය.

## තැරැව් කිරීම හා ප්‍රචාරය කිරීම

39. නීතිඥවරයකු විසින් කවර හෝ අවස්ථාගත කරුණු යටතේ තමා විසින් ම හෝ වෙනත් තැනැත්තකු මඟින් හෝ කෙළින් ම හෝ වක්‍ර ලෙස තැරැව් කිරීම නොකළ යුතුය.
තැරැව් කිරීම යන්නට -

(1) සේවාදායකයන් කැඳවා ගැනීම පිණිස කිසියම් කොමිස් මුදලක් ගෙවීමක් හෝ ප්‍රතිඡ්ඨාවක් මත කවර හෝ ආකාරයකට යම් තැනැත්තකු හෝ සේවාවක් යොදා ගැනීම :
(2) සේවාදායකයන් තමා වෙත අසාධාරණ ලෙස කැඳවා ගැනීමේ කාර්යය සඳහා යම් ආකාරයකින් ප්‍රචාරය කිරීම ඇතුළත් වේ.

40. නීතිඥවරයකු විසින් තමාගේ වෘත්තීය නාම පුවරුව තම කාර්යාලයෙහි හෝ පදිංචි නිවසෙහි හෝ තම කාර්යාලයෙහි සහ/ හෝ පදිංචි නිවසෙහි ප්‍රදර්ශනය කරනු ලැබිය හැකි ය.

(අ) එම නාම පුවරුවෙහි පහත දැක්වෙන විස්තර පමණක් සඳහන් කළ හැකිය :-
(1) නීතිඥවරයාගේ නම සහ/හෝ නීති ව්‍යාපාර ආයතනයේ නම
(2) "නීතිඥවරයා", "ප්‍රසිද්ධ නොතාරිස්වරයා" "සොලිසිටර්වරු", "දිවුරුම් කොමසාරිස් -වරයා" "ස.වි.නි.නො.ම" වැනි නීතිඥවරයාගේ වෘත්තීය සුදුසුකම් සහ ඔහු නීති ව්‍යාපාර ආයතනයක සාමාජිකයකු නම්, එම ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන්ගේ සහ සාමාජික යන්ගේ වෘත්තීය සුදුසුකම්:
(3) විශ්ව විද්‍යාල උපාධි වැනි ශාස්ත්‍රීය සුදුසුකම්:
(4) කාර්යාල වේලාවල්.

(ආ) ආලෝකමත් කරන ලද නාම පුවරු හෝ නීතිඥවරයකුගේ කාර්යාලයට යන මාර්ගය දක්වන පුවරු හෝ භාවිත නොකළ යුතු ය.
(ඇ) එම නාම පුවරු, නීතිඥවරයාගේ කාර්යාලය හෝ පදිංචි ස්ථානය හෝ සේවාදායකයාට සොයාගත හැකි වන අන්දමේ ප්‍රමාණයකින් යුක්ත විය යුතු ය.

41. නීතිඥවරයකු තමා වෘත්තියේ යෙදෙන ස්ථානය වෙනස් කරන අවස්ථාවක තමාගේ අළුත් ලිපිනය දැක්වෙන දැන්වීමක් තමා කලින් සිටි ස්ථානයෙහි සෑහෙන කාල සීමාවක් තුළ තැබිය යුතු ය.

42. නීතිඥවරයකුට වෘත්තීය ලිපිද්‍රව්‍ය තබාගත හැකිය. එම වෘත්තීය ලිපිද්‍රව්‍යවල පහත දැක්වෙන තොරතුරු පමණක් අඩංගු කළ යුතු ය:-

(1) නීතිඥවරයාගේ නම සහ/ හෝ නීති ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය, පදිංචි ලිපිනය, දුරකථන සහ ටෙලෙක්ස් අංකය, තැපැල් පෙට්ටි අංකය, නීති ව්‍යාපාර ආයතනයට විදුලි පණිවුඩ ලිපිනය, සහ කාර්යාල වේලාවල්
(2) නීති ව්‍යාපාර ආයතනයේ හවුල් ව්‍යාපාරිකයන්ගේ හෝ සාමාජිකයන්ගේ නම්
(3) නීති ව්‍යාපාර ආයතනයේ හවුල් ව්‍යාපාරිකයන්ගේ හෝ සාමාජිකයන්ගේ ඇතුළුව නීතිඥවරයාගේ වෘත්තීය සහ ශාස්ත්‍රීය සුදුසුකම්:
(4) නීති ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, අවස්ථාවෝචිත පරිදි "නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු " යනුවෙන් හෝ "නීතිඥවරු සහ සොලි සිටර්වරු" යනුවෙන් ද හෝ එහි විස්තර වාක්‍යයෙහි සඳහන් විය යුතුය.

43. නීතිඥවරයකුට හෝ නීති ව්‍යාපාර ආයතනයකට තමාගේ හෝ නීති ව්‍යාපාර ආයතනයේ හෝ නම, ලිපිනය සහ විස්තර වාක්‍යය චෙක්පත්වල, ලියම් කවරවල සහ ලේඛනවල යොදාගත හැකි ය.

44. නීතිඥවරයකු විසින් තමාගේ නම්, වෘත්තීය ලිපිනය, හෝ පදිංචි ලිපිනය, දුරකථන අංකය, වෘත්තීය සහ ශාස්ත්‍රීය සුදුසුකම් සහ ඔහු නීති ව්‍යාපාර ආයතනයක සාමාජිකයකුව සිටි නම්, එකී නීති ව්‍යාපාර ආයතනයේ නම් අඩංගු කාඩ් පතක් භාවිත කරනු ලැබිය හැකි ය.

45. නීතිඥවරයකු විසින්, හෝ නීති ව්‍යාපාර ආයතනයක් විසින් හෝ තමාගේ නැතහොත් එකී ව්‍යාපාර ආයතනයේ නම, ලිපිනය සහ විස්තර වාක්‍යය 40 වන වගන්තියේ විධි විධාන සලසා ඇති පරිදි, යම් නීතිඥ ලැයිස්තුවක හෝ නීති නාමාවලියක හෝ දුරකථන නාමාවලියක් ද ඇතුළුව වෙනත් යම් නාමාවලියක හෝ ඇතුළත් කර ගනු ලැබිය හැකි ය.

46. නීතිඥවරයකු විසින්, යම් නීතිමය හෝ වෘත්තීය කරුණක් සම්බන්ධයෙන් ගුවන් විදුලියෙන් කථාවක් පැවැත්වීම, රූපවාහිනියෙන් පෙනී සිටීම, දේශනයක පැවැත්වීම, පුවත්පත් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම හෝ පුවත්පතකට තම අදහස්

දැක්වීම හෝ පළ කිරීම පිණිස නිබන්ධනයක් හෝ ලිපියක් ලිවීම හෝ කරනු ලැබිය හැකිය.

47. යම් අවස්ථාවක තමාගේ නම ප්‍රචාරය කරනු ලබන බවට නීතිඥවරයකු දැන සිටින හෝ ඒ බව විශ්වාස කිරීමට ඔහුට හේතු තිබෙන අවස්ථාවක, ප්‍රචාරය කිරීම් සම්බන්ධයෙන් වූ යම් ආචාර ධර්මයකට හෝ රීතියකට එම ප්‍රචාරය කිරීම පටහැනි නොවන බවට ඔහු වගබලා ගතයුතුය.

48. නීතිඥවරයකු විසින් සේවාදායකයකුගේ හෝ කලින් සිටි සේවාදායකයකුගේ කටයුතුවලට අදාළ යම් කරුණක් පිළිබඳව ඒ සේවාදායකයාගේ කැමැත්ත නොමැතිව, යම් සම්මුඛ සාකච්ඡාවක් හෝ ගුවන් විදුලි හෝ රූපවාහිනී ප්‍රචාරයක් කිරීම හෝ එවැනි කරුණක් ප්‍රසිද්ධ කිරීමට ඉඩ දීම හෝ කරනු නොලැබිය යුතුය.

49. නීතිඥවරයකු විසින් -

(1) තමාගේ වෘත්තීය කටයුතු සම්බන්ධයෙන් :

( 2 ) යම් කරුණක් සම්බන්ධයෙන් තමාට උපදෙස් ලැබී ඇති විටක ඒ කරුණට අදාළ රහස්‍ය තොරතුරු අනාවරණය නොකර සහ ඒ කරුණ සම්බන්ධයෙන් තමා පෙනී සිටින බවට හෝ එම කාරණයේ දී තමා විසින් ඉටු කරනු ලබන කොටස පිළිබඳව ප්‍රචාරයක් නොකර විස්තර ප්‍රසිද්ධ කළ හැකි නම් මිස, ඒ කාරණය සම්බන්ධයෙන් කිසිම විස්තරයක් පළ කිරීමට සැලැස්වීමට හෝ අවසර දීම හෝ නොකළ යුතුය.

## අධිකරණය සමඟ සම්බන්ධතාව

50. යුක්තිය පසිඳලීම සඳහා පිහිටුවන ලද යම් අධිකරණයක්, විනිශ්චයාධිකරණයක් හෝ වෙනත් අධිකරණයක් ඉදිරියේ යම් නීතිඥවරයකු පෙනී සිටින අවස්ථාවක, නීතිඥ මණ්ඩලයේ ස්වාධීනත්වයට මැදිහත් නොවන පරිදි, ඒ අධිකරණයට,

විනිශ්චයාධිකාරයට හෝ වෙනත් ආයතනයට සහාය වීමේ යුතුකමක් ඒ නීතිඥවරයාට පැවරෙන්නේය.

51. යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් ඉදිරියේ යම් නීතිඥවරයකු පෙනී සිටින අවස්ථාවක ඒ අධිකරණය හෝ විනිශ්චයාධිකාරය නොමඟ යැවීම හෝ රැවටීම ඒ නීතිඥවරයා විසින් කරනු නොලැබිය යුතු අතර, එසේ නොමඟ යැවීමට හෝ රැවටීමට තම සේවාදයකයාට ඉඩ දීම ද කරනු නොලැබිය යුතුය.

52. යම් කරුණක් ඉදිරිපත් කරනු නොලැබුවහොත්, ඉන් යුක්තිය ඉටු නොවීමට ඉඩ තිබේ නම්, ඒ කරුණ අධිකරණයේ අවධානයට ගෙන ඒම චෝදක පක්ෂය සඳහා පෙනී සිටින නීතිඥවරයකුගේ යුතුකම වන්නේය.

53.(i) විරුද්ධ පාර්ශ්වයට, සාක්ෂිකරුවකුට හෝ වෙනත් යම් තැනැත්තකුට නින්දා කිරීම හෝ ඔවුන් හෙළා දැකීම හෝ පිණිස පමණක් ම නීතිඥවරයකු විසින් ප්‍රශ්න නැඟීම හෝ යම් ප්‍රකාශයක් කිරීම හෝ නොකළ යුතුය.

(ii) නීතිඥවරයකු විසින් සාක්ෂිකරුවකුට අයහපත් චරිතයක් ඇති බව, ඔහු වංචාවක් කර ඇති බව. ඔහු සාපරාධි වරදක් සිදු කර ඇති බව හෝ ඔහු කෙරේ විශ්වාසයක් තැබිය නොහැකි බව ආරෝපණය කරන හෝ හඟවන අන්දමේ ප්‍රකාශ කිරීම හෝ ප්‍රශ්න සාක්ෂිකරුවකුගෙන් ඇසීම, ඒ චෝදනාව පදනම් රහිත බවට හෝ අසත්‍ය බවට හෝ විශ්වාස කිරීමට ඒ නීතිඥවරයාට හේතු ඇත්නම්, කරනු නොලැබිය යුතුය.

54. නීතිඥවරයකු යුක්තිය පසිඳලීම සඳහා පිහිටුවනු ලැබූ යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක් හෝ වෙනත් ආයතනයක් ඉදිරියේ පෙනී සිටින අවස්ථාවක තම පෞද්ගලික හැඟීම්වලින් සහ / හෝ සම්බන්ධතාවලින් හෝ තමාගේ හැසිරීම කෙරෙහි බලපෑම් ඇති වීමට ඔහු විසින් ඉඩ දෙනු නොලැබිය යුතු ය.

55. යම් විනිශ්චයකාරවරයකු හෝ වෙනත් මුලාසනාරූඪ නිලධරයකු හෝ ඉදිරියේ යම් නීතිඥවරයකු පෙනී සිටින අවස්ථාවක, ඔහු විසින් ඒ විනිශ්චයකාරවරයා හෝ නිලධරයා හෝ සමඟ, විරුද්ධ පාර්ශ්වය නොමැති අවස්ථාවල දී නඩුවක විෂය කරුණු සාකච්ඡා නොකළ යුතුය.

## වෘත්තියේ සෙසු සාමාජිකයන් සමඟ සම්බන්ධතා පැවැත්වීම.

56. සියලු වෘත්තීය කටයුතුවල දී නීතිඥවරයකු තම වෘත්තියේ යෙදී සිටින සෙසු සාමාජිකයන් වෙත පූර්ණ ආචාරශීලිත්වයෙන්, ගරුත්වයෙන් සහ සාධාරණත්වයෙන් යුක්තව ක්‍රියා කළ යුතු ය.

57. විරුද්ධ පාර්ශ්වය නියෝජනය කරන නීතිඥවරයා ඉදිරිපිට දී සහ ඔහුගේ එකඟත්වය ඇතිව හැර, නීතිඥවරයකු විරුද්ධ පාර්ශ්වය සමඟ කටයුතු කිරීම සුදුසු නොවන්නේ ය.

58. යම් වෘත්තීය කරුණක් ඉටු කිරීමේ දී තම පෞද්ගක හැඟීම් වලින් සහ/ හෝ පෞද්ගලික සම්බන්ධතා වලින් ඊට බලපෑම් සිදු වීමට නීතිඥවරයකු ඉඩ නොතැබිය යුතු ය.

59. නීතිඥවරයකු යම් වෘත්තීය කරුණක දී නීතිඥවරයකු නොවන තැනැත්තකුට එරෙහිව පෙනී සිටින විට ද ඉහත දැක්වෙන රීති අදාළ වන්නේය.

60. වැදගත් සහ ප්‍රවීන නීතිඥවරයකු සම්බන්ධයෙන් වූ විට වෘත්තීයේ ඔහුගේ සම වෘත්තිකයන් විසින් අවමානයෙන් සලකනු ලැබිය හැකි අපකීර්තිමත් හෝ අගරු හෝ ලෙස සාධාරණව සැලකිය හැකි වන්නා වූ හෝ ඔහු නීතිඥවරයකු ලෙස සිටීමට නුසුදුසු කරන්නා වූ හෝ සමාවක් දිය නොහැකි වන්නා වූ හෝ කිසියම් ආකාරයකට හැසිරීම නීතිඥවරයකු විසින් කරනු නොලැබිය යුතුය.

61. නීතිඥවරයකුට නුසුදුසු ආකාරයකට හැසිරීම නීතිඥවරයකු විසින් කරනු නොලැබිය යුතු ය.

62. ඉහත සඳහන් රීති විස්තරාත්මක නොවන්නේය.